සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

8 ශ්‍රේණිය | කතෝලික ධර්මය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයː

- 1 - 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ලූක් සුබ ආරංචියේ ආරම්භක සිද්ධිය වන්නේ,
    (i) ස්නාවක ජොහොන්ගේ උපත (ii) ජේසුස් වහන්සේගේ වංශාවලිය
    (iii) සෙකරියස් තුමාගේ යාග පූජාව (iv) ජේසුස් වහන්සේගේ බෞතිස්මය

02. ඊශ්‍රායෙල් වරුන්ගේ විමුක්තිය අපේක්ෂාවෙන් සිටි දිවැසිවරයා වන්නේ,
    (i) සිමියොන් තුමාය (ii) ලූක් තුමාය
    (iii) මාක් තුමාය (iv) මතෙව් තුමාය

03. ඇති අය නැති අය සමග බෙදා ගැනීමට ආරාධනා කරන්නේ,
    (i) මෝසෙස් තුමා ය. (ii) ආබ්‍රහම් තුමා ය.
    (iii) මාක් තුමා ය. (iv) ස්නාවක ජොහාන් තුමා ය.

04. ගලීලයේ සේවාවෙන් පසු ජේසුස් වහන්සේ යන ලද්දේ,
    (i) සමාරියට ය. (ii) ජෙරුසලමට ය.
    (iii) ජෙරිකෝවට ය. (iv) බෙතානියට ය.

05. ගැලවීමේ ඉතිහාසය සූදානම් කිරීමට දෙවියන් වහන්සේ කැඳවූ පුද්ගලයා වන්නේ,
    (i) ආබ්‍රහම් තුමා ය. (ii) ඊසාක් තුමා ය.
    (iii) මෝසෙස් තුමා ය. (iv) ජාකෝබ් තුමා ය.

06. ජේසුස් වහන්සේ සබත් දින නාසරෙත් නුවර ධර්මශාලාවේ දී කියවූ දිවැසිවර ග්‍රන්ථය වන්නේ,
    (i) යෙසායා ග්‍රන්ථය (ii) ලූක් සුභ ආරංචිය
    (iii) ජොහාන් සුභාරංචිය (iv) ගීතාවලිය

07. ''මා මෙය දැනගන්නේ කෙසේද? මම මහල්ලෙක්මි.'' මෙලෙස ප්‍රකාශ කරන ලද්දේ,
    (i) මරියතුමිය (ii) ජුසේතුමා
    (iii) සෙකරියස්තුමා (iv) එලිසබෙත්තුමිය

08. ජේසුස් වහන්සේගේ වචන හා ක්‍රියාවල හරය වූයේ,

(i) දේව රාජ්‍යයේ උදාවයි. (ii) ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන ආගමනයයි.

(iii) සුභාරංචිය ප්‍රකාශ කිරීමයි. (iv) අසරණයන්ට පිහිට වීමයි.

09. ජේසුස් වහන්සේ සිදුකළ සුව කිරීම හා සම්බන්ධ ප්‍රාතිහාර්යයක් වන්නේ,

(i) මාරුත දමනය (ii) ජායිරස්ගේ දියණිය උත්ථාන කිරීම

(iii) සබත් දින කුදු ස්ත්‍රීය සුව කිරීම (iv) පන්දහසකට කෑම දීම.

10. දෙවියන් වහන්සේට හිමි වන්දනාව හා සේවයෙහි යෙදීමට අදාළ ශුද්ධාත්ම දීමනාව වන්නේ,

(i) තේරුම් ගැනීම (ii) දේව භක්තිය

(iii) දේවභය (iv) ධෛර්යය

- **11 - 15 තෙක් ප්‍රශ්නවලට දැක්වෙන වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

11. ජේසුස් වහන්සේ කන්‍යාවකගෙන් ඉපදීමට නියමිත බව යෙසාය දිවැසිවරයා ප්‍රකාශ කරන ලදී. ( )

12. දේව පණිවිඩය අවිශ්වාස කළ සෙකරියස් තුමාට හිමි වූ විපාකය වූයේ ඇවිදීමට නොහැකි වීමයි. ( )

13. ජේසුස් වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්ය ගණන තුනකි. ( )

14. මරණීය පාපයක් කර ඇත්නම් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනිමට පෙර පාපොච්චාරණයක් සිදුකරගත යුතුය. ( )

15. වැඩිහිටි ප්‍රසාද ස්නාපනයකදී මීසම් සේවක පියතුමාට අභිවෘද්ධි ආලේපය දානය කළ හැකිය. ( )

- **16 - 20 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

16. ජේසුස් වහන්සේගේ උපත ........................................................................ ආනන්ද ජනක පුවතක් බව දේව දූතයෝ ප්‍රකාශ කළ හ.

17. ........................................................................ සුභ ආරංචිය දේශනා කරනුවස් උන්වහන්සේ මා ආලේප කළ සේක.

18. ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රි භෝජනයේදී ........................................................................ ස්ථාපිත කළ සේක.

19. ........................................................................ මගින් ශුද්ධ වූ සභාවේ පූර්ණ සහභාගීත්වය ලැබේ.

20. අධිරාජ්‍යයේ සියලු වැසියන්ගේ සංගණනයක් ගැනීමට ........................................................................ වෙතින් නියෝගයක් නික්මිණි.

( දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ, සියලු ජනතාවට, අගොස්තුස් අධිරාජ්‍යයා, අභිවෘද්ධි ආලේපය, දිළිඳුන් හට)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (1) ශුද්ධ වූ සභාවේ වර්තමාන දෘශ්‍යමාන නායකයා නම් කරන්න.
    (2) ලූක් සුබ ආරංචිය හඳුන්වන තවත් නම් දෙකක් ලියන්න.
    (3) ලූක් සුබ ආරංචියේ එන කාන්තා චරිත දෙකක් නම් කරන්න.
    (4) ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳව තොරතුරු සඳහන් කරන සුභාරංචි කතුවරයන් දෙදෙනා නම් කරන්න.
    (5) වපුරන්නා පිළිබඳ උපමාවේ බීජ වැටුණු බිම් වර්ග දෙකක් නම් කරන්න.
    (6) මාරුත දමනයේ ප්‍රාතිහාර්යයෙන් අපට ලැබෙන මඟ පෙන්වීම් දෙකක් ලියන්න.
    (7) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම සඳහා සූදානම් වන ආකාර දෙක නම් කරන්න.
    (8) ලූක් තුමා පමණක් සඳහන් කරන උපමා දෙකක් නම් කරන්න.
    (9) ශුද්ධාත්ම ඵල දෙකක් නම් කරන්න.
    (10) අභිවෘද්ධි ආලේපය දානය කිරීමේ දිව්‍ය යාගයේ ඇතුළත් වන පිළිවෙත් දෙකක් නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

02. (1) ලූක් සුභාරංචියේ පරමාර්ථය ලියන්න. (ල. 02)
    (2) ලූක් සුභාරංචියේ සඳහන් පණිවිඩ තුන නම් කරන්න. (ල. 03)
    (3) ලේඛකයෙක් වූ ලූක් තුමාගෙන් ඔබට ගත හැකි ආදර්ශ පහක් නම් කරන්න. (ල. 05)

03. (1) ස්නාවක ජොහාන් තුමාගේ දෙමාපියන් නම් කරන්න. (ල. 02)
    (2) ස්නාවක ජොහාන් තුමා දේශනා ලබා දුන් ජන කණ්ඩායම් තුනක් නම් කරන්න. (ල. 03)
    (3) ස්නාවක ජොහාන්තුමාගෙන් ඔබට ගත හැකි ආදර්ශ පහක් නම් කරන්න. (ල. 05)

04. (1) ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපනය ලබන අවස්ථාවේදී ඇසුණු හඬ ශබ්දය ලියා දක්වන්න. (ල. 02)
    (2) ජේසුස් වහන්සේ මුහුණ දුන් පරීක්ෂා තුන නම් කරන්න. (ල. 03)
    (3) පරීක්ෂා ජයගත් ජේසුස් වහන්සේගෙන් යොවුන් වියේ ඔබට ගත හැකි ආදර්ශ පහක් නම් කරන්න. (ල. 05)

05. (1) දේව රාජ්‍ය යනු කුමක්ද? කරුණු දෙකකින් දක්වන්න. (ල. 02)
    (2) දේව රාජ්‍ය පිළිබඳ කියවෙන උපමා තුනක් නම් කරන්න. (ල. 03)
    (3) දේව රාජ්‍ය අන් අය වෙත ගෙනයාමට ඔබට කළ හැකි කාර්යයන් පහක් නම් කරන්න. (ල. 05)

06. (1) දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල. 02)
    (2) දිව්‍ය සත්ප්‍රසාදයට පූර්ව සලකුණු තුනක් නම් කරන්න. (ල. 03)
    (3) දිව්‍ය සත්ප්‍රසාදයෙන් ජීවමාන වූ ජේසුස් වහන්සේ ලබාගත් ඔබ කරන යහපත් ක්‍රියා පහක් ලියන්න. (ල. 05)

07. (1) ශුද්ධාත්මයාණන් වහන්සේ හැඳින්වීමට පුරාණ ගිවිසුමේ යෙදෙන නම් දෙකක් ලියන්න. (ල. 02)
    (2) අභිවෘද්ධි ආලේපය නමැති දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමට සුදුසුකම් තුනක් නම් කරන්න. (ල. 03)
    (3) ඔබ ජීවිතයට ශුද්ධාත්ම වරම්පතා යාච්ඤාවක් ලියන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 3 ) 02. ( 1 ) 03. ( 4 ) 04. ( 2 ) 05. ( 1 ) 06. ( 1 ) 07. ( 3 ) 08. ( 1 ) 09. ( 3 ) 10. ( 2 )

11. (✓) 12. ( x ) 13. ( x ) 14. (✓) 14. (✓) 16. සියලුම ජනතාවට 17. දිළිඳුන් හට

18. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ 19. අභිවෘද්ධි ආලේපය 20. අගෝස්තුස් අධිරාජයා (ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (1) අති උතුම් 14 වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා
(2) කාන්තාවන්ගේ සුභාරංචිය, යාච්ඤාවේ සුභාරංචිය, අන්‍ය ජාතීන්ගේ සුභාරංචිය, අන්‍ය ජාතීන්ගේ සුභාරංචිය, ශුද්ධාත්මයාණන්ගේ සුභාරංචිය,
(3) එළිසබෙත් තුමිය, අන්නාදිවැසිවරිය, මරියතුමිය, පව්කාර ස්ත්‍රීය, කුදු ස්ත්‍රීය, ජෙරුසලමේ ස්ත්‍රීන්
(4) ලූක් තුමා හා මතෙව් තුමා
(5) මග දිගේ, පස් නැති ගල් බිමේ, කටු පඳුරු අතර, සරු බිමේ.
(6) ජේසුස් වහන්සේ සැබෑ දේව පුත්‍රයා බව, ස්වභාව ධර්මය පවා උන්වහන්සේට කීකරු බව.
(7) ආත්මික සුදානම හා ශාරීරික සුදානම
(8) යහපත් සමාරියා පිළිබඳ උපමාව, නැති වූ පුත්‍රයා පිළිබඳ උපමාව, ධනපතියා හා ලාසරස් පිළිබඳ උමපාව.
(9) ස්නේහය, ප්‍රීතිය, සමාදානය, ඉවසීම, කරුණාව, යහපත්කම, පිරිසිදුකම.
(10) ආරම්භක පිළිවෙත, දේව වාක්‍ය පිළිවෙත, අභිවෘද්ධි ආලේපය දානය කිරීම සඳහා අපේක්ෂකයන් කැඳවීම, ක්‍රිස්මා තෙලයෙන් ආලේප කිරීම, පඬුර පිදීම, විශ්වාසින්ගේ යැදුම. (ලකුණු 2 x 10 = 20)

02. (1) ජේසුස් වහන්සේ ජුදා ජාතීන්ගේ පමණක් නොව මුළු මිනිස් සංහතියේම ගැලවුම්කරුවා බව. (ල. 02)
(2) ප්‍රීතිය හා තුති පැසසුම්, තමන් සතු දේ වගකීමෙන් පරිහරණය කිරීම, ආගමික වත් පිළිවෙත්. (ල. 03)
(3) සුභාරංචිය අන් අය වෙත ගෙනයාම, ගැටලු අභියෝග නොතකා තම සේවය දියත් කිරීම, ආගමික පොතපත රචනා කිරීම, සමාජයේ කොන්වූවන් පිළිගැනීම ආදී කරුණු සලකා බලා ලකුණු දෙන්න. (ල. 05)

03. (1) සෙකරියස් තුමා සහ එළිසබෙත් තුමිය (ල. 02)
(2) ප්‍රභූ ජනතාව, සාමාන්‍ය ජනතාව, අයකැමියන්, හමුදා නිලධාරීන් (ල. 03)
(3) තම ජීවිතය ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් කැපකිරීම, සමාජ අසාධාරණයන් හෙළා දැකීම, සැමට එකසේ සැලකීම, අභියෝග හමුවේ නොසැලී මුහුණ දීම, සියල්ල ඉවසීමෙන් දරා ගැනීම. (ල. 05)

04. (1) ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි. (ල. 02)
(2) ගල් ගෙඩියක් පාන් ගෙඩියක් වන්නට අණ කිරීම, යක්ෂයාට නමස්කාර කිරීමට කීම, දේව මාලිගාවේ කොත මුදුනින් පනින්න යැයි පැවසීම. (ල. 03)
(3) ජීවිතයේදී මුල් තැන දෙවියන් වහන්සේට ලබාදීම, ක්‍රිස්තුන් වහන්සේව පමණක් විශ්වාස කිරීම, වෙනත් ඇදහිලි පසුපස නොයාම, යාච්ඤාමය ජීවිතයක් ගත කිරීම ආදි කරුණු සලකා බලා ලකුණු දෙන්න. (ල. 05)

05. (1) දෙවියන් වහන්සේගේ පාලනයට නතුවීම, දේව අභිමතයට මිනිස් සමාජය නතුවීම. (ල. 02)
(2) වපුරන්නා පිළිබඳ උපමාව, නිධානය, මුතු ඇටය හා දැල පිළිබඳ උපමාව. (ල. 03)
(3) ක්‍රිස්තුන් වහන්සේ ගැන අන් අයට කියා දීම, යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම, අසරණයන්ට පිහිටවීම, පාසල තුළ ආගමික වත් පිළිවෙත් ඉටු කිරීම, සමාජයේ කොන්වූවන් පිළිපැදීම. (ල. 05)

06. (1) භෝජනයකි, යාගයකි, ගිවිසුමකි, ස්තුති කිරීමකි. සිහි කිරීමකි, දේව ප්‍රසාද නිධානයකි. (ල. 02)
(2) මෙල්කිසදෙක්ගේ යාගය, මන්නාභෝජනය, ඊශ්‍රායෙල් ජනතාවගේ පාස්කු භෝජනය, පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්ය. (ල. 03)
(3) අසරණයන්ට පිහිටවීම, සියල්ලන්ට එක සේ සැලකීම, ආගමික වත් පිළිවෙත් වල නිරතවීම, වැඩිහිටියන්ට ගරු කිරීම, සිරිත් පිළිපැදීම. (ල. 05)

07. (1) ආත්මානුභාවය, දේවාත්මානුභාවය, ශද්ධාත්මය (ල. 02)
(2) ප්‍රසාද ස්නාපනය ලබා තිබීම, අවුරුදු 14 සම්පූර්න වී තිබීම, ඉෂ්ඨ වරප්‍රසාදය ඇතිව සිටීම, ප්‍රසාද නිධාන ලබා ගැනීමට ඇති ආශාව, ධර්මෝපදේශයක් ලබා තිබීම. (ල. 03)
(3) සිසුවා ලියා ඇති යාච්ඤාවට අදාළව ලකුණු ලබා දෙන්න. (ල. 05)